**ශීර්ෂය 116 - සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුවේ නම** |
|---|---|
| 298 | මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව |
| 300 | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| 301 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 302 | සමූපකාර සේවක කොමිෂන් සභාව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 04 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,046,654,000 ක් වූ අතර සමාලොචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,734,897,369 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදයන්ගෙන් ඉතිරිවීම් රු.681,256 ත් රු. 249,456,693 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1 ත් සියයට 18 ත් අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 116 | 1,426,981,000 | 1,177,524,307 | 249,456,693 | 17 |
| 298 | 288,850,000 | 275,399,427 | 13,450,573 | 5 |
| 300 | 253,279,000 | 206,930,535 | 46,348,465 | 18 |
| 301 | 64,704,000 | 64,022,744 | 681,256 | 1 |
| 302 | 12,840,000 | 11,020,356 | 1,819,644 | 14 |
| එකතුව | 2,046,654,000 | 1,734,897,369 | 311,756,631 | 15 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 04 කට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11601 | 6,000,000 | 5,314,034 | 3,400,000 | 5,307,650 | 30,000,000 | 19,896,540 |
| 29801 | 9,000,000 | 2,225,958 | 3,500,000 | 4,966,404 | 35,000,000 | 18,469,703 |
| 30001 | 7,500,000 | 3,631,453 | 3,500,000 | 8,448,680 | 46,000,000 | 20,237,280 |
| 30101 | 6,000,000 | 3,382,630 | 2,000,000 | 2,820,779 | 21,000,000 | 12,112,984 |
| 30201 | 2,000,000 | 1,130,640 | 300,000 | 548,397 | 6,000,000 | 2,103,090 |

### 2.2.2 ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවකට අදාළ වාණිජ අත්තිකාරම් ගිණුම් 02 ක් 2003 ජනවාරි 01 දින හා 2005 ජනවාරි 01 දින ඇවර කිරීමට තීරණය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | අත්තිකාරම් ගිණුම් කාර්යය | ගිණුම් අංකය | ඇවර කිරීමට තීරණය කර තිබුණු දිනය | 2013 දෙසැම්බර් 31 දිනට ගතවී තිබුණු කාලය (වර්ෂ) |
|---|---|---|---|---|
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | (i) මුළුතැන්ගෙය හා බේකරි අත්තිකාරම් ගිණුම | 7000/0/0/0300/0002 | 2003 ජනවාරි 01 | 11 |
| | (ii) ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ හා බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුම | 7000/0/0/0300/0003 | 2005 ජනවාරි 01 | 09 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.3.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 04 ක 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.68,518,728 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 7002/0000/00/0046/0013/000 | 31,658,128 |
| මිනුම් ඒකක ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුව | 7002/0000/00/0327/0013/000 | 4,271,896 |
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 7002/0000/00/0107/0013/001 | 32,027,841 |
| සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0018/0013/000 | 528,253 |
| සමූපකාර සේවක කොමිෂන් සභාව | 7002/0000/00/0156/0013/000 | 32,610 |
| **එකතුව** | | 68,518,728 |

## 2.3.2 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 03 ක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.224,625,816 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0029/000 | 26,418,556 |
| මිනුම් ඒකක ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0006/0069/000 | 44,445,215 |
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0008/0013/000 | 76,673,230 |
| -එම- | 6000/0000/00/0015/0023/000 | 53,071,263 |
| -එම- | 6000/0000/00/0015/0155/000 | 8,755,872 |
| සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0006/0080/000 | 8,604,605 |
| | 6000/0000/00/0015/0156/000 | 6,657,075 |
| **එකතුව** | | **224,625,816** |

**2 වන කොටස**

**---------------**

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**-----------------------------------------------**

## 1. ශීර්ෂ 116 - සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

**-----------------------------------------------------------**

### 1.1 විගණන විෂය පථය

**--------------------**

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 02 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

**-------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණය

**----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (උ) දක්වා

වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල්වල මූල්‍ය ප්‍රකාශන පහත දක්වා ඇති වර්ෂ වෙනුවෙන් 2014 ඔක්තෝබර් 20 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

| | **ආර්ථික මධ්‍යස්ථානයේ නම** | **ඉදිරිපත් කර නොතිබුණු මූල්‍ය ප්‍රකාශන** |
|---|---|---|
| (i) | මීගොඩ | 2003 ආරම්භක වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා සහ 2013 වර්ෂය |
| (ii) | නාරාහේන්පිට | 2008 ආරම්භක වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා |
| (iii) | රත්මලාන | 2009 ආරම්භක වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා |
| (iv) | වැලිසර | 2003 ආරම්භක වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා සහ 2013 වර්ෂය |
| (v) | වේයන්ගොඩ | 2007 ආරම්භක වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා |
| (vi) | කැප්පෙටිපොල | 2001 ආරම්භක වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා සහ 2013 වර්ෂය |
| (vii) | දඹුල්ල | 1999 ආරම්භක වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා |
| (viii) | නුවරඑළිය | 2006 ආරම්භක වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා |
| (ix) | කුරුඳුවත්ත | 2012 හා 2013 වර්ෂ |
| (x) | කන්දෙහන්දිය | 2004 ආරම්භක වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා |
| (xi) | තඹුත්තේගම | 2005 ආරම්භක වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා |
| (xii) | ඇඹිලිපිටිය | 2003 ආරම්භක වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා |
| (xiii) | පිළියන්දල | 2010 ආරම්භක වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

**-------------------------**

පහත සඳහන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. .

(i) ගොඩනැගිලි කුලී වෙනුවෙන් අමාත්‍යාංශය හා සතොස ආයතනය අතර ඇතිකර ගෙන තිබුණු බදු ගිවිසුම හා ගොඩනැගිලි කුලී තක්සේරු වාර්තා.

(ii) රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයේ ව්‍යාපාර පරිශ්‍ර කුළියට දීමේ විධිමත් බදු ගිවිසුම හා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ව්‍යාපාර පරිශ්‍ර තක්සේරු වාර්තා.

(iii) දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙහි එකතුව රු.64,754,667 ක් වූ ගිණුම් විෂයයන් 7 කට අදාල තොරතුරු .

(iv) විසර්ජන ගිණුමේ ජංගම නොවන සංචලන වාර්තාවේ දක්වා තිබුණු එකතුව රු.705,117 ක් වූ යන්ත්‍රෝපකරණ අපහරණයට අදාල විස්තර.

**(ඇ) විගණන විමසුම්වලට පිළිතුරු දීම**

**----------------------------------**

පහත සඳහන් විගණන විමසුම් සඳහා අමාත්‍යාංශය විසින් පිළිතුරු ලබා දි නොතිබුණි.

(i) අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 06 කට 2014 මාර්තු 31 දින වන විට ද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණ අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.24,440,926 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේදී දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය සම්බන්ධයෙන් විගණන විමසුම් 04 ක් නිකුත් කර තිබුණත්, 2014 මාර්තු 31 දින වන විට ද ඒ සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු 10,226,725 ක් විය.

**(ඈ) අධිවැය**

**--------**

116-1-3-2201 දරන වැය විෂය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනය රු.660,000 කින් ඉක්මවා උපයෝජනයන් කර තිබුණි.

**(ඉ) අයවැය විචලනය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 10 ක් සඳහා සළසා තිබුණු රු.106,625,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 15 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 90 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඊ) පොදු තැන්පත් ගිණුම**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 ජුනි 03 දිනැති අංක 218/2011 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව පැරණි පොදු තැන්පත් ගිණුමෙහි තිබුණු රු.5,240,956 ක් වූ ශේෂයෙන් 2011 අගෝස්තු 26 දින ඉහත සඳහන් චක්‍රලේඛයේ 02 ඡේදයට පටහැනිව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන 6000/0/0/15 දරන පොදු තැන්පත් ගිණුමකට මාරු කර තිබුණි. එම තැන්පතුවල කාලය වසර 2 ක් ඉක්මවා තිබුණත්, 2014 අප්‍රේල් 23 දින වන විටත් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2009 දෙසැම්බර් 31 දින වන විට එකතු කළ අගය මත බදු හා රඳවා ගැනීමේ බදු වශයෙන් එකතුව රු.1,360,220 ක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. එම මුළු මුදලම දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර 2013 අප්‍රේල් 01 දින ඉන් රු.209,847 ක් විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල නඩත්තු අරමුදල් ගිණුමට මාරු කර තිබුණි. ඉතිරි රු.1,150,373 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(iii) 2012 දෙසැම්බර් 26 දින ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් ලැබී තිබුණු රු.800,160 ක් පොදු තැන්පත් ලෙස ගිණුම්ගත කර 2013 ජනවාරි 01 දින වන විට එහි ශේෂය රු.379,440 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදි එයින්

රු.24,800 ක් වැය කර තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දින වන විට එහි ශේෂය රු.354,640 ක් වි තිබුණි. එම තැන්පත් සඳහා වර්ෂ 2 කට වැඩි කාලයක් ගත වි තිබුණත් අදාල කාර්ය සඳහා උපයෝගි කර ගැනිමට හෝ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(උ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 11601 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව හිඟහිට තිබුණු ණය ශේෂවල එකතුව රු.347,902 ක්වු අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ii) ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගේ වර්ෂ 04 කට වැඩි කාලයක සිට පැවැත එන රු.131,200 ක ණය ශේෂ සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර එම ශේෂය අයකර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(iii) විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.4,262 ක ණය ශේෂයක්, එම නිලධාරියා විශ්‍රාම ගොස් වසර 8 ක කාලයක් ඉක්මවා තිබුණත්, එම නිලධාරියාගෙන් එම ණය ශේෂය අයකර ගැනිමට ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.4 හා 4.2.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iv) සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් වසර 04 ක හා වසර 11 ක සිට පැවත එන එකතුව රු.62,776 ක් වූ ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(v) මියගිය නිලධාරියෙකුගේ රු.149,665 ක ණය ශේෂය මාස 16 ක සිට පැවත එන නමුත් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කර එම ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04 ඡේදය අනුව, රජයේ සේවකයෙකු වෙත ගෙවිය හැකි උපරිම ආපදා ණය ප්‍රමාණය රු.250,000 ක සීමා කළ යුතු වුවත්, එම සීමාව ඉක්මවා නිලධාරීන් තුන්දෙනෙකුට එකතුව රු.445,750 ක් වූ ආපදා ණය වැඩියෙන් ගෙවා තිබුණි.

එම වැඩිපුර ගෙවා තිබුණු ආපදා ණය 2014 මාර්තු 25 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**1.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 28 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 නොවැම්බර් 26 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**1.4.2 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබූ නමුත් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. 2013 වර්ෂයේදී විමර්ශන කටයුතු පමණක් සිදුකර තිබුණි.

**1.5 වත්කම් කළමණාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියෙන් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා, එම වාර්තා 2014 මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත 2014 ජූනි 16 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2011 ,2012 සහ 2013 යන වර්ෂ තුනෙහි අමාත්‍ය කාර්යාලය, නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය හා භාෂා පරිවර්තන අංශයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

## 1.6 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 135 සිට 139 දක්වා | යොමුගත මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව ගෙවීම් වවුචර් පිළියෙල කර නොතිබුණි. |
| **(ආ)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| | 2.4 මාර්ගෝපදේශය | දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට සැපයුම් හා සේවා ලබා ගැනීමේදී ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගැයීම් කමිටුවක් මගින් සිදු කර නොතිබුණි. |
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| | 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන චක්‍රලේඛය | දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ නිලධාරීන්ට දේපළ ණය ලබා දීම රාජ්‍ය බැංකු මගින් පමණක් සිදුකළ යුතු වුවත්, ඊට අනුකූල නොවී භාර අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඈ) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | |
| | (i) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ් 423 දරන චක්‍රලේඛයේ | කිසියම් අරමුදලක් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත |

| | |
|---|---|
| 3.3 (ආ) ඡේදය | කිරීමට හැකි වන පරිදි හේතු දක්වමින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට වාර්තා කළ යුතු වුවද, දඹුල්ල හා කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානවල කළමනාකරණ භාර අරමුදල් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ii) 4 ඡේදය | අරමුදලේ අරමුණුවලට අනුකූලව පිළියෙල කරන ලද වාර්ෂික අයවැය ලේඛනය අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද, දඹුල්ල හා කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානවල කළමනාකරණ භාර අරමුදල් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (iii) 4.2 (ආ) ඡේදය | කළමනාකරණ භාර අරමුදලට ලැබෙන සියළුම ලැබීම් වෙනුවෙන් නිල ලදුපතක් නිකුත් කිරීමට දඹුල්ල, කැප්පෙටිපොළ හා මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන කටයුතු කර නොතිබුණි. |
| (iv) 4.2 (ඇ) ඡේදය | පවත්වාගෙන යන බැංකු ගිණුම් හා පොත්පත් නිතිපතා සසඳා එහි ප්‍රගතිය රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට දඹුල්ල, කැප්පෙටිපොළ හා මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන පියවර ගෙන නොතිබුණි. |

**1.7 කාර්යසාධනය**

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) අනුරාධපුර සමූපකාර රෝහල ඉදිකිරීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 අප්‍රේල් 30 දිනැති අංක 1651/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශයට පවරා ඇති කාර්යයන් අතර මහින්ද චින්තන ඉදිරි දැක්ම හා රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්ති මත පිහිටා අමාත්‍යාංශයේ විෂයයන්ට හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාලව ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතු විය. එයට අනුකූල නොවී අනුරාධපුර සමූපකාර රෝහලේ 2 වන මහල නවීකරණය කිරීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව හා ගිවිසුමකින් තොරව ඉදිකිරීම් ආයතනයක් වෙත ලබාදී තිබුණි.

(ii) ලිපිගොනුව අනුව ඉහත සමූපකාර රෝහල ගොඩනැගිල්ල රු. මිලියන 24 ක ඇස්තමේන්තුවක් යටතේ මහල් 4 කට සැලැසුම් කර තිබූ අතර 2012 වර්ෂයේදී එහි 2 වන මහල ඉදිකිරීම සඳහා රු. මිලියන 7 ක් එම ඉදිකිරීම් ආයතනයට ගෙවා තිබුණු නමුත් එම මුදල් අදාල කාර්යයේ යොදවා නොතිබුණි.

**(ආ) විලච්චිය වී මෝල ඉදිකිරිම**

2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මිලියන 5 කට විලච්චිය වී මෝල ඉදිකිරීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව එම ඉදිකිරීම්වල දුර්වලතා පැවැති අතර ඒ සම්බන්ධව කොන්ත්‍රාත්කරු හා උපදේශන සමාගමට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරන ලෙස උතුරු මැද පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයා ඉල්ලීමක් කර තිබියදීත් ඒ පිළිබඳ සැළකීමකින් තොරව සහ 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වී නොමැතිව තිබියදීත් 2013 වර්ෂයේ දී ද එකතුව රු. 8,953,571 ක මුදලක් එම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි.

**1.8** **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

---------------------------------------

2013 දෙසැම්බර් මාසය වෙනුවෙන් පිළියෙළ කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව, නිකුත් කර මාස 06 ඉක්මවා ඇති නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ වටිනාකම රු. 20,126 ක් වූ චෙක්පතක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.9** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රජයේ ආයතනයක් සතු ඉඩමක් අමාත්‍යාංශයට පවරා ගැනීමකින් තොරව එහි අම්පාර ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරිම සිදු කර තිබුණු අතර ඒ සඳහා රු.32,952,951 ක් වූ ඇස්තමේන්තුව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කර නොතිබුණි. මෙම ඉදිකිරිම සඳහා කොන්ත්‍රාත්තුව සහ උපදේශක සේවය ලබාගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව සිදු කර තිබුණි. ඒ අනුව තරඟකාරිව මිල ගණන් කැඳවීමකින් තොරව ඉදිකිරිම් කටයුතු රජයට අයත් ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගමක් වෙත හා උපදේශක කටයුතු පෞද්ගලික උපදේශක ආයතනයක් වෙත කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. මෙලෙස ප්‍රදානය කර තිබුණු කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. පර්චස් 193.65 ක්වූ රජය සතුව පැවති ඉඩමේ ස්ථාපිතව තිබුණු ගොඩනැගිල්ල රු.395,570 ක් වැය කර කඩා ඉවත් කර සතොස පරිශ්‍රයේ ආර්ථික මධ්‍යස්ථානය ඉදිකර තිබුණි.

(ආ) අමාත්‍යාංශය යටතේ වූ රත්මලාන හා නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානවල කළමණාකරණය කිරීම සඳහා කළමණාකරණ භාරයක් පිහිටුවා නොතිබුණි. එම මධ්‍යස්ථානවල ආදායම් රජයේ ආදායමට බැරකර නොතිබුණු අතර එම මධ්‍යස්ථානවලට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී පොසොන් උත්සවය වෙනුවෙන් දන්සැලක් සඳහා රු.51,000 ක් වටිනා ලොකු ලූණු කිලෝ ග්‍රෑම් 1,016 ක් ලබා දී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ රැස්වීමකට සහභාගී නොවූ 21 දෙනෙකුට රු. 11,000 ක සංග්‍රහ වියදම් ද කළමනාකරණ භාරයෙන් වැය කර තිබුණි.

## 1.10 අවිධිමත් ගනුදෙනු

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර බව නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම

--------------------------------------------------------------

කිලිනොච්චිය ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 80 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. ඉදිකිරීම් කටයුතු, සැලැසුම් කිරීම් හා ප්‍රමාණ පත්‍ර සැකැසීමේ කාර්යයන් අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන් ගෙන් බැහැරව පෞද්ගලික සමාගම් දෙකකට පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) අදාල සමාගම් දෙකකට එම කාර්ය ඉටු කිරීමේ කාර්ය පවරා තිබුණත්, ඒ සඳහා ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු විධිමත් ලෙස ඉටු නොකරන විට ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා වන පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි.

(iii) කොන්ත්‍රාත්තුවේ දෝෂ සඳහා වගකීම් කාල සීමාව අවසන් වන තුරු කොන්ත්‍රාත්කරුට කරනු ලබන ගෙවීම්වලින් ප්‍රමාණයක් රඳවා ගෙන ගෙවීම් කර නොතිබුණි.

(iv) අක්කර 6 පර්චස් 140 ක් වූ ඉහත සඳහන් ඉදිකිරිම සිදු කළ භූමිය 2013 දෙසැම්බර් 31 දින වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මුල්ගල තබා වසර 2 1/2 ක් ගතවී තිබුණත්, ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

### (ආ) සේවාවක් ලබා නොගෙන වැටුප් හා වේතන ගෙවීම

-------------------------------------------------------

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ආරක්ෂක සේවාව පෞද්ගලික ආරක්ෂක සමාගමක් වෙත පවරා දී තිබියදීත් මධ්‍යස්ථානය විසින් මුරකරුවන් දෙදෙනෙකුට 2012 වර්ෂයේදී වැටුප් හා වේතන ලෙස රු.532,430 ක් ගෙවා තිබුණි.

**(ඇ) අධිකාර බලය නොමැති ගනුදෙනු**

**----------------------------------**

නීතිපති දෙපාර්තමේන්තුවේ අංක 5/2/1/10/3 හා 2006 මැයි 08 දිනැති ලිපිය අනුව භාරයේ රැස්වීම් සඳහා සහභාගීවීම වෙනුවෙන් දීමනා ගෙවීමට විධිමත් අනුමැතියක් ලබා ගත යුතු වුවත්, විධිමත් අනුමැතියක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේදී දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙහි පවත්වා තිබුණු රැස්වීම් සඳහා භාර සාමාජිකයන්ට එකතුව රු.368,550 ක දීමනා ගෙවා තිබුණි.

**1.11 පාඩු හා හානි**

**--------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය සතු වාහනයක් අනතුරට ලක්වීමෙන් රු.408,546 ක අලාභයක් සිදු වී තිබුණි. එම අලාභයෙන් රු.393,676 ක් රක්ෂණ ආයතනයෙන් ලැබී තිබුණි. ඒ අනුව රු.14,744 ක අලාභය වගකිව යුතු අයගෙන් හෝ එසේ නොවන විට කපා හැරීමට හෝ 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර මූලික වාර්තාව හා පූර්ණ වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රාජ්‍ය සංස්ථාවකට 2013 පෙබරවාරි 08 දින තාවකාලික පදනම මත අනුයුක්ත කර තිබුණු වාහනයක් 2013 පෙබරවාරි 13 දින අනතුරකට ලක් වී තිබුණි. එහි අළුත්වැඩියාව වාහනයේ නියෝජිත ආයතනය සිදු කර ඒ සඳහා රු.724,352 ක් හා තවත් පෞද්ගලික ආයතනයකට රු.287,100 ක්ද, වශයෙන් එකතුව රු.1,011,452 ක් වැය කර අළුත්වැඩියා කර තිබුණි. ඒ සඳහා රක්ෂණ ආයතනයකින් රු.81,600 ක් ලැබී තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අවසන් වාර්තාව 2014 ඔක්තෝබර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. අලාභහානියෙන් රු.929,852 ක් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ අලාභහානිය කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 ජූලි 31 දින සතොස ගොඩනැගිල්ලේ පිහිටි අමාත්‍යාංශ කාර්යාලයේ ඇතිවී තිබූ ගින්න පිළිබඳව වාර්තා කිරීම සඳහා, අතිරේක ලේකම් (පාලන) ගේ අංක සීඅයිටී/2/1/සතොස අලාභහානි හා 2013 අගෝස්තු 08 හා 2013 අගෝස්තු 12 දිනැති ලිපි මගින් මු.රෙ. 104(1) යටතේ අභ්‍යන්තර පරීක්ෂණයක් හා අමාත්‍යාංශ මට්ටමේ

පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි. අභ්‍යන්තර පරීක්ෂණ වාර්තාව 2014 අප්‍රේල් 26 දින වන විටත් ඉදිරිපත් නොකිරීම හා අමාත්‍යාංශ මට්ටමේ පරීක්ෂණ වාර්තාවේ අසම්පූර්ණවීම හේතුකොට ගෙන ගින්නෙන් වූ අලාභය ලෙස දක්වා තිබුණු රු. 677,047 ක් වූ වටිනාකමෙහි නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

**1.12 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) රත්මලාන ආර්ථික මධ්‍යස්ථානය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයේ පරිශ්‍රය කුළියට දීමේදී, මූලික මුදල් එකවර තැන්පත් කළ යුතු වුවත්, එසේ ක්‍රියා නොකර මූලික මුදලින් කොටසක් පමණක් අයකළ අවස්ථා 5 ක් විය.

(ii) රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයෙහි වූ කඩකාමර 128 කින් කඩ කාමර 19 කින් කිසිදු මුදලක් කුලී වශයෙන් අයකර නොතිබුණු අතර ඉන් කාමර 2 ක් කුලියට දී නොතිබුණි.

(iii) 2009 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු කඩ කුලී එකතුව රු.11,699,990 ක් වූ අතර ඉන් එකතුව රු.4,688,750 ක් කුලී වශයෙන් හඳුනාගෙන නොතිබුණි.

**(ආ) දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1984 ජූනි 08 දිනැති අංක 300/14 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරාගත් ඉඩමක 1999 වර්ෂයේ දී රු.115,000,000 ක් වැය කර මධ්‍යස්ථානය ආරම්භකර තිබූ නමුත් අදාළ භූමිය කළමනාකරණභාරය වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් ආරක්ෂක සේවා සමාගමක් වෙත සේවය නොසපයන ලද දින 76 ක් සඳහා රු.56,400 ක් ගෙවා තිබුණි.

(iii) කළමනාකරණභාරයේ 2012 වර්ෂයේ අවසානය වන විට ඉතිරි කිරීමේ ගිණුමෙහි රු.4,159,567 ක ශේෂයක් පැවති අතර එය ඵලදායි ආයෝජන මාර්ගයක යෙදවීමට අවධානය යොමුකර නොතිබුණි.

**1.13 මානව සම්පත් කළමණාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 17 | 07 |
| (ii) තෘතියික මට්ටම | 05 | 02 | 03 |
| (iii) ද්විතියික මට්ටම | 269 | 177 | 92 |
| (iv) ප්‍රාථමික මට්ටම | 49 | 39 | 10 |
| (v) වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 06 | 04 | 02 |
| එකතුව | 353 | 239 | 114 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අමාත්‍යාංශයෙන් වෙනත් ආයතන වෙත නිලධාරීන් අනුයුක්ත කිරීම් කර නොතිබුණු බව දන්වා තිබුණත්, අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතන 5කින් ලද තොරතුරු අනුව නිලධාරීන් 103 දෙනෙකු අමාත්‍යාංශයට අනුයුක්ත කිරීම් කර ඇති බව අනාවරණය විය.

## 2. ශීර්ෂ 298 - මිනුම් ඒකක, ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

මිනුම් ඒකක, ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 01 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මිනුම් ඒකක, ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) **අයවැය විචලනය**

වැය විෂයයන් දෙකක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 19 ත් සියයට 87 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) **පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.44,445,215 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂයය අංක 29801 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිගහිට තිබුණු ශේෂවල එකතුව රු.151,665 ක් වූ අතර එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් සථාපිත කර නොතිබුණු අතර රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අභ්‍යන්තර විගණනය සිදුකර තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පිඑෆ්/ සමීක්ෂණ මණ්ඩල /01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2014 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත

ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2014 ජුනි 09 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**2.6 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව තනතුරක වැඩ බලන කාලය මාස 03 ක උපරිමයකට සීමාවිය යුතු වුවත්, එය නොසළකා 2009 මැයි 05 දින සිට 2013 වර්ෂය අවසාන වන විටත් නොපුරවන ලද පුරප්පාඩු වූ තනතුරක වැඩ බලන පදනමින් අධ්‍යක්ෂවරයකු වැඩ ආවරණය කිරීම සඳහා පත්කර තිබුණි.

**2.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| (i). ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 12 | 04 |
| (ii). තෘතියික මට්ටම | 30 | 02 | 28 |
| (iii). ද්විතියික මට්ටම | 202 | 115 | 87 |
| (iv). ප්‍රාථමික මට්ටම | 95 | 63 | 32 |
| **එකතුව** | **343** | **192** | **151** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 151 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 3. ශීර්ෂ 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

---

### 3.1 විගණන විෂය පථය

---

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 3.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 88 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන හා දෙපාර්තමේන්තු පොත් අතර වැය විෂයක රු.4,279 ක වෙනසක් පැවැතුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.43,887,570 ක්වූ තැන්පතු 200 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තු පොත් අනුව, අංක 6000/0000/00/0015/0155/000 දරන පොදු තැන්පත් ගිණුමෙහි 2013 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය රු.8,755,872 ක් වූවද, තැන්පතු ලේඛනය අනුව එය රු.2,137,047 ක් විය. ඒ අනුව තැන්පත් ලේඛනය නිතිපතා යාවත්කාලීන කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 30001 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳව 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව හිඟහිටි ශේෂවල එකතුව රු.2,976,004 ක් වූ අතර එම හිග ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 19,461,366 ක් වි තිබුණත්, භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.19,144,525 ක්වි තිබුණි. ඒ අනුව රු.316,841 ක වෙනස මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව සසඳා නොතිබුණි.

(iii) සැසඳුම් ප්‍රකාශය අනුව 2013 වර්ෂය අවසාන ශේෂය රු.19,461,366 ක් වුවද, දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබූ පාලන ගිණුම අනුව එම ශේෂය රු.19,442,325 ක් වී තිබුණි. ඒ අනුව රු.19,040 ක වෙනසක් අනාවරණය විය.

(iv) 2013 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 96 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.356,718 කින් 2014 දෙසැම්බර් 08 දින වන විට එක් නිලධාරියෙකුගෙන් රු.770 ක් පමණක් අය කර තිබුණි. ඉතිරි රු.355,948 ක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය හා 2004 ඔක්තෝබර් 24 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(v) 2013 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරීන් 78 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,171,302 කින් 2014 දෙසැම්බර් 08 දින වන විට නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.535,240 ක් පමණක් අය කර තිබුණි. ඉතිරි නිලධාරීන් 74 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.636,062 ක් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.4 හා 4.2.5 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(vi) 1999 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලය තුළ මියගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂවල එකතුව රු.544,786 ක් වූ අතර ඉන් රු.397,366 ක් වූ ණය ශේෂ වර්ෂ 05 කට අධික කාලයක් මුළුල්ලේ පැවැත එමින් පැවැතුණි. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය 4.4 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(vii) 2013 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කළ නිළධාරීන් 15 දෙනෙකුගෙන් එකතුව රු.736,234 ක් වූ ණය ශේෂ අය කර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(viii) සේවය අතහැරගිය නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,051,474 ක ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුත්තක් අවසාන කර වසා දැමීම**

---

විෂය අංක 7000/0/0/0300/0003 දරන අත්තිකාරම් ගිණුම් කටයුත්ත අවසාන කර වසා දැමීමට අදාලව වර්ෂ 21 ක් කල් ගතවී තිබුණත්, එකතුව රු.339,769,709 ක් වූ අයවිය යුතු ශේෂද, එකතුව රු.509,651,145 ක් වූ පියවිය යුතු ශේෂද හා එකතුව රු.169,870,060 ක් වටිනා අවසානයක් නොකළ වත්කම්ද පැවතුණි.

පහත සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හේතුවෙන් ගනුදෙනු බේරා වසා දැමීමේ ගිණුම සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කළ නොහැකි විය.

(i) අතිරික්ත පදනම මත එවකට සමූපකාර අමාත්‍යාංශය වෙත ලබා දී තිබූ වාහනය සඳහා රු.600,000 ක මුදලක් 2009 ජූනි 05 දින ලැබී තිබුණද, එම වත්කමේ වටිනාකම හා ඊට අදාල සමුච්චිත ක්ෂය වෙන් කිරීම්, ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකා නාවික හමුදාවට පවරා දෙන ලද තක්සේරු වටිනාකම රු.4,000,000 ක් වූ බූස්ස ගබඩා සංකීර්ණයේ පිරිවැය හා ලී බඩු උපකරණ අපහරණය කිරීමේ ගිණුමට බැර කළ රු.174,445 ක්වූ පිරිවැය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු බව මීට පෙර විගණන වාර්තාවෙන් පෙන්වා දීමෙන් පසු ඒ පිළිබඳව භාණ්ඩාගාරය දැනුවත් කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව 2009 පෙබරවාරි 17 දිනැති අංක අයිඒ/408/14 ආහාර දරන පිළිතුරු ලිපියෙහි සඳහන් කර තිබුණද, ඒ අනුව 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බැරකම් පියවීමේ ප්‍රකාශයේ දක්වා ඇති වත්කම් ඉවත් කිරීමේ ගිණුම් 03 ක එකතුව රු.27,446,023 ක බැර ශේෂ සම්බන්ධයෙන් ඊට අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය හඳුනාගෙන ගැලපීම් කර නොතිබුණි.

(iv) මෙම අත්තිකාරම් ගිණුම 2005 ජනවාරි සිට ගිණුම් කටයුතු අවසාන කර වසා දැමීම සිදු කරමින් පවතින අතර එදිනට පැවති නිරවුල් නොකළ ණය ශේෂ රු.3,772,135 සහ 1985 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා කාලය තුළ ඇතිවූ කාරක පාඩුව වූ රු.4,612,880,682 ක් කපා හැරීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(v) 2012 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම්වලට ඇතුළත් රු.48,216,458 ක් වූ තොග හිඟ ණයගැති ශේෂය තුළ 2013 වර්ෂයේදී ශේෂ ඉදිරියට ගෙන ඒමේදී ඇතිවී තිබූ රු.65,425 ක වෙනස සමාලෝචිත වසරේදී ද ගලපා නොතිබීම හේතුවෙන් තොග හිඟ ණයගැති ශේෂය රු.65,425 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(vi) විගණනයට ඉදිරිපත් කළ උපලේඛනය අනුව, වර්ෂය අවසානයේදී සමූපකාර ණය ශේෂය රු.200,061,968 ක් වූවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.199,141,138 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.915,830 ක වෙනසක් විය.

(vii) ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් බාහිර ආයතන වෙත කුලියට ලබා දී තිබුණු ගබඩා 63 කින් 2013 දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ ගබඩා කුලිය රු.69,765,511 ක් විය. ඉන් ගබඩා 23 ක් මේ වන විට නැවත පවරාගෙන තිබුණද, කුලියට ගත් අයගෙන අය විය යුතුව ඇති හිඟ කුලිය වූ රු.31,636,229 ක් 2014 සැප්තැම්බර් 10 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(viii) 2002 හා 2003 වර්ෂවලදී රු.1,072,198 ක් වටිනා මෝටර් රථ 3 ක් කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය හා එවකට සමූපකාර අමාත්‍යාශයට භාරදී තිබුණි. එසේ භාරදී වර්ෂ 11 ක් ඉක්මවා තිබුණද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් පැවරුම් අගයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ix) ආයතන හා පුද්ගලයින් 10 ක් සඳහා බදු පදනම මත ලබා දී තිබූ ගොඩනැගිලි වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ විදුලි හා ජල ගාස්තුවල එකතුව රු.2,527,004 ක් විය.

(x) 2013 දෙසැම්බර් 31 දිනට ගණන් බේරා වසා දැමිය යුතු ගිණුම්වල දක්වා තිබුණු රු.338,697,511 ක් වූ ණයගැති ශේෂ අය කර ගැනීම ඉතා දුර්වල මට්ටමක පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- දිස්ත්‍රික්ක 22 කට අයත් විවිධ සේවා සමූපකාර සමිති 179 කට සහල්, පිටි, සීනි, ආහාර මුද්දර හා භූමිතෙල් මුද්දර ණය පදනම මත නිකුත් කිරීම හේතුවෙන් සමූපකාර සමිති වෙතින් 2013 ජනවාරි 01 දිනට අයකර ගත යුතුව තිබුණු ණය මුදල ගණන් බේරා වසා දැමිය යුතු ගිණුම්

අනුව රු.199,366,138 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේදී එම මුදලින් රු.220,000 ක් පමණක් අයකරගෙන තිබුණි. ණය අයකර ගැනීම සියයට 0.09 ක ප්‍රමාණයක් ගෙන තිබීමෙන් ණය අයකර ගැනීම් දුර්වල මට්ටමක පැවති බව තහවුරු විය.

- 2013 ජනවාරි 01 දිනට එකතුව රු.48,216,459 ක් වූ තොග හිඟ ණය ගැති ශේෂයෙන් රු.135,176 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයවී තිබූ අතර ණය අයකර ගැනීම සියයට 0.28 ක ප්‍රමාණයක් වී තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකර ගැනීමට තිබූ ණය ශේෂය රු.48,081,283 ක් වී තිබුණි.

- 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 20 කට වැඩි කාලයක සිට පැවැත එන වෙනත් ණයගැති ශේෂවල එකතුව රු.1,992,362 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් කිසිදු ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි.

- රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සංස්ථාවලින් වර්ෂ 12 සිට වර්ෂ 19 ක් දක්වා වූ කාල පරාසයක සිට හිඟහිටි ණය ශේෂය රු.89,203,828 ක් වූ අතර, ඉන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි.

- සේවය හැරගිය හෝ සේවයෙන් පහකළ හෝ වැඩ තහනම් කළ හෝ ගබඩා භාරකරුවන් 74 දෙනෙකුගෙන් අයවිය යුතු රු.19,713,090 කින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අය කර නොතිබුණි.

- තොරතුරු සොයා ගත නොහැකි ගබඩා භාරකරුවන් 53 දෙනෙකුගෙන් අයවිය යුතු රු.4,195,442 ක් සහ ස්ථාන මාරුවී ගිය ගබඩා භාරකරුවන් 40 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.9,852,571 ක් වූ තොග හිඟ අධිභාර ශේෂයෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

- අධිභාර කිරීමට එරෙහිව නිලධාරියෙකු විසින් අභියාචනා අධිකරණය වෙත ගොනු කරන ලද නඩු අංක 1464/2002 හි තීරණය අනුව

රු.2,382,580 ක අධිභාර පැනවීම නිෂ්ප්‍රභා කර ඇති බව 2009 ජූනි 24 දිනැති ආහාර කොමසාරිස්ගේ ලිපියක් මගින් දැනුම් දී තිබුණද, එය මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට හෝ හෙළිදරව් කිරීමට සමාලෝචිත වර්ෂයකදී ද කටයුතු කර නොතිබුණි.

(xi) විස්තරාත්මක උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, කාල විශ්ලේශණ හා ශේෂය සනාථ කිරීම් ආදි වූ අවශ්‍ය සාක්ෂි නොතිබීම නිසා රු. 1,117,051,713 ක් වූ මුදලට අදාල ගිණුම් විෂයයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1. අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණද, ඒ අනුව, අභ්‍යන්තර විගණනය සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

### (අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජීත වත්කම්

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 වර්ෂයේදී රු.18,292,550 ක් වැය කර අලුත්වැඩියා කරන ලද වේයන්ගොඩ ගබඩා පරිශ්‍රයේ වූ ගබඩා 04 ක මුළු ගබඩා ධාරිතාවය වී මෙට්‍රික් ටොන් 10,800 ක් වුවද, විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 14 දින වන විට එම ගබඩා තුළ වී මෙට්‍රික් ටොන් 541 ක් පමණක් ගබඩා කර තිබුණි.

(ii) වේයන්ගොඩ විද්‍යාත්මක ගබඩාවේ සහල් මෙට්‍රික් ටොන් 4,500 ගබඩා කළ හැකි වුවත් විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 14 දින වන විට සහල් මෙට්‍රික් ටොන්

618 ක් ගබඩා කර තිබුණි. එය මුළු ගබඩා ධාරිතාවයෙන් සියයට 14 ක ප්‍රමාණයක් වී තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 මාර්තු 21 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණද, එම වාර්තාවෙන් පෙන්වාදී තිබුණු භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 858 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව සතු ධාරිතාවය මෙට්‍රික් ටොන් 153,275 ක් වූ ගබඩා 46 ක් බාහිර පාර්ශවයන් වෙත අවිධිමත් ලෙස ලබා දී තිබුණි.

## 3.6 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (අ) මුදල් රෙගුලාසි 34 | 2012 ජූලි 02 දින දෙපාර්තමේන්තුව විසින් රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් තොරව සහල් ආරක්ෂිත තොග ගබඩා කර තැබීම සඳහා ආද්‍රිතාවය පාලනය කරන ලද විද්‍යාත්මක ගබඩා ඉදිකිරීම II යන මැයෙන් රු.මිලියන 188.6 ක ඇස්තමේන්තුවක් මත ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර තිබුණද, මුදල් රෙගුලාසි 34 ප්‍රකාරව ඒ සඳහා විධිමත් පරිදි විධිවිධාන සළසා ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 373 | 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ පියවිය යුතු ශේෂයක් නොතිබුණි. අත්තිකාරම් කටයුත්ත අවසාන කර ගිණුම් වසා දැමීමට අදාල ගණන් බේරා වසා දැමීමේ ගිණුම් අනුව 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂයරු.24,992,879 ක් ව් තිබුණි. මෙම ශේෂය අත්තිකාරම් කටයුත්ත වසා දැමීම ආරම්භයේ සිටම පැවත එන ශේෂයක් වු බැවින් එය හඳුනා ගැනීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 518 (7) (ආ) | අත්තිකාරම් ගිණුම් කටයුත්ත වසා දැමීමට අදාල ගිණුම්වල ඉටු කළ යුතු කටයුතු හා ගනුදෙනු බේරා වසා දැමීම නිම කිරීමට බලාපොරොත්තු වන දින ගණන් බේරා වසා දැමිය යුතු ගිණුම්වල පෙරවදනෙහි සඳහන් කළයුතු වූවත්, එහි නිශ්චිත දිනයක් ප්‍රකාශයට පත්කළ නොහැකි බව සඳහන් කර තිබුණි. |
| (ඈ) | මුදල් රෙගුලාසි 756 | මුදල් රෙගුලාසිය ප්‍රකාර එකතුව රු.169,285,130 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 4ක් වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඉ) | මුදල් රෙගුලාසි 1645 | දෛනික ධාවන සටහන් අනුව, මාසික සංසිද්ධි වාර්තා සකස් කළ යුතු වූවද, දෙපාර්තමේන්තුව සතු වාහන කිසිවක් සම්බන්ධයෙන් එසේ සාරාංශ සකස් කර නොතිබුණි. |

**3.7 කාර්යසාධනය**

---------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

---------------------------------------------

2008 වර්ෂයේ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව නැවත ආරම්භ කරනු ලැබුයේ මෙ.ටොන් 100,000 ක ආරක්ෂිත සහල් තොගයක් පවත්වාගෙන යාමේ අරමුණෙන් වුවද, ඉන් බැහැරව දෙපාර්තමේන්තුව සතු ගබඩාවලින් සියයට 89 ක් වෙනත් ආයතන වෙත කුලී පදනම මත සහ කුලී අයකිරීමකින් තොරව ලබා දී තිබුණි.

**3.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-------------------------------------

**ගැලපුම් කළ යුතු ශේෂ**

------------------------

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව වර්ෂ 03 ක් ඉක්මවූ රු.1,303,065 ක් වූ උපලබ්ධි නොවූ තැන්පතු හා ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.1,300,065 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව අනාවරණය විය.

**3.9 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

--------------------------------

ත්‍රිකුණාමලය ධාන්‍යගම නිවාස සංකීර්ණයේ තිබූ නිවාස 352 ක් නිවාස සංවර්ධන අධිකාරිය මගින් 1982 වර්ෂයේ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් මෙකී නිවාස සමාගමක සේවකයන්ට සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට කුලියට ලබා දී තිබුණි. එම නිවාසවලින් 33ක් නැවත දෙපාර්තමේන්තුවට භාර නොදී අතුරු බදු දී තිබුණි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1969 අංක 07 දරන රාජ්‍ය නිවාස පනතේ 6 වැනි වගන්තියේ බලතල අනුව ආහාර දෙපාර්තමේන්තුවට අයත් රජයේ ගොඩනැගිලිවල සන්තකය ආපසු පවරා ගැනීමේ බලය ආහාර කොමසාරිස් වෙත පවරා තිබුණි. මෙම භූමියේ අයිතිය මේ දක්වා ආහාර කොමසාරිස් වෙත පැවරී නොතිබීම හේතුවෙන් අනවසර පදිංචිකරුවන් ඉවත්කිරීමට නොහැකි වී තිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

--------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පටිපාටියෙන් බැහැරවීම

-------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වේයන්ගොඩ ස්වාභාවික වායු සංසරණ ක්‍රමවේද සහිත ගබඩාව ඉදිකිරීමේ අදියර II සඳහා ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති උපදේශන සේවා සපයන ආයතන හෝ පුද්ගලයන් වෙතින් මිල ගණන් කැඳවීමක් නොකර රු.1,390,157 කට විශ්ව විද්‍යාල මහාචාර්යවරයෙකුව උපදේශන සේවා සඳහා පත්කර ගෙන තිබුණි. අදාල උපදේශක විසින් ශාක්‍යතා යෝජනා, තෝරා ගත යුතු තාක්ෂණ උපකරණ, සේවා පහසුකම් සපයන්නන් හා සුදුසු කොන්ත්‍රාත්කරුවන් පිළිබඳව සිය නිර්දේශයන් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ඉහත සඳහන් ගබඩාව ඉදිකිරීම් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව රු.23,169,285 කට අදාල කොන්ත්‍රාත්තුව රජයේ සංස්ථාවකට ප්‍රදානය කර තිබුණි. එම සංස්ථාව විසින් එම මිලටම එකී කොන්ත්‍රාත්තුව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ තත්ත්වය අසතුටුදායක බවට ඉදිකිරීම පරීක්ෂා කළ උපදේශක සමාගම විසින් වාර්තා කර තිබූ අතර කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම් අත්සන් කළ රජයේ සංස්ථාව වෙනුවට CWE කන්ස්ට්‍රක්ෂන් සමාගම බිල්පත් ඉදිරිපත් කර අදාල මුදල් ලබාගෙන තිබුණි.

(iii) වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ ගබඩා 04 ක් නවීකරණය කිරීම සඳහා රු.18,292,550 ක වටිනාකමකට ප්‍රසම්පාදනයෙන් බැහැරව රජයේ සංස්ථාවට පවරා තිබූ අතර එම සංස්ථාව විසින් මෙම කොන්ත්‍රාත්තුව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් වෙත පවරා තිබූ නමුත් කාර්මික නිලධාරි වාර්තාවක් ලබාගෙන, ලිඛිතව එම කොන්ත්‍රාත් භාර ගැනීමට කටයුතුකර නොතිබුණි.

### (ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

-------------------------------------

විද්‍යාත්මක ගබඩා ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 188.6 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබූ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ඒ සඳහා අමාත්‍ය

මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර අදාල ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක්ද, සිදුකර නොතිබුණි. රු.මිලියන 4.9 ක ඇස්තමේන්තුවක් මත ඉදිකර තිබූ විද්‍යාත්මක ගබඩා ඉදිකිරීම ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණි.

## 3.11 පාඩු හා හානි

--------------

නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(i) අදියර I යටතේ ඉදිකරන ලද විද්‍යාත්මක ගබඩාවේ මුළු ධාරිතාවය මෙට්‍රික් ටොන් 4,500 ක් වූවද, 2013 වර්ෂයේ අවසන් වන විටත් මෙට්‍රික් ටොන් 652 ක් පමණක් ගබඩා කර තිබුණි. එම සහල් මිලදී ගැනීම හා ගබඩා කිරීම සඳහා දරා තිබුණු වියදමට වඩා අඩු මිලට එහි සහල් අලෙවි කිරීම නිසා දෙපාර්තමේන්තුවට දැරීමට සිදුවූ අලාභය රු.7,467,112 ක් විය.

(ii) වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ රු.4,500,000 ක මුදලකට පාලම් තරාදියක් සවිකිරීම සඳහා සමාගමකට භාරදී තිබූ අතර එම වටිනාකම තුළ තරාදිය සවිකිරීම සඳහා වන සිවිල් ඉදිකිරීම්වල වටිනාකම රු.1,205,357 ක් විය. මෙම පාලම් තරාදිය දෙපස කොන්ක්‍රීට් කරන ලද බෑවුම් ප්‍රදේශ ගිලා බැස තිබුණු අතර ඒවා පහතට පුපුරා යාමෙන් ඒ මතින් ලොරි ගමන් කිරීමේදී ඉක්මණින් විනාශ වීම පිළිබඳව නිගමනය කිරිම පිණිස සිවිල් ඉංජිනේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි. එමෙන්ම පාලම් තරාදිය ආවරණය වන පරිදි වහලයක් ඉදිකර නොතිබීමත් නිසි නඩත්තු කිරීමකින් තොරව පාලම් තරාදිය මළ බැඳෙමින් පැවතුණි.

## 3.12 අනාර්ථික ගනුදෙනු

-----------------------

විද්‍යාත්මක ගබඩා ආරම්භ කරනු ලැබුවේ පරිභෝජනයට සුදුසු වසෙන් විසෙන් තොර ගුණාත්මක සහල් සැපයිමේ අරමුණු ඇතුව වුවද, විද්‍යාත්මක ගබඩාවේ සහල්වලට ගුල්ලන් බෝවීම නිසා ධුමායන කටයුතු සිදුකර තිබුණි. එමෙන්ම ගබඩාවේ සියළුම යාන්ත්‍රික කොටස් වරින් වර අක්‍රියතාවයට පත්වීම හේතුවෙන් අළුත්වැඩියා කරමින් පැවති අතර මෙම ව්‍යාපෘතිය අසාර්ථක තත්ත්වයකට පත්වී තිබූ බව නිරීක්ෂණය විය.

## 3.13 මානව සම්පත් කළමණාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යොෂ්ඨ මට්ටම | 05 | 03 | 02 | - |
| (ii) | තෘතීයික මට්ටම | 02 | - | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 118 | 53 | 65 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 126 | 64 | 72 | 10 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | **එකතුව** | **251** | **121** | **141** | **11** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 141 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂ 301 - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### 4.1 විගණන විෂය පථය

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 03 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ

ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දිමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දිමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 4.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 02 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක හා සියයට 28 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 10 අනුව, කාර්ය මණ්ඩල වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී හැකිතාක් දුරට තථ්‍ය අවශ්‍යතාවය පදනම් කරගත යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා වේතන වැය විෂයය යටතේ ප්‍රතිපාදිත රු.21,780,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.1,030,700 ක් මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයකට මාරුකර තිබුණි.

(iv) දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් හඳුනාගත හැකි වන පරිදි ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ රු.8,117,167 ක් වූ තැන්පතු 75 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) විෂය අංක 30101 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,610,242 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ii) පාලන ගිණුම හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ එකතුව අතර රු.20,774 ක වෙනසක් විය. එම වෙනස නිවැරදි කිරීමට ගැලපීම් සිදු කර තිබුණත්, තවදුරටත් රු.13,765 ක වෙනසක් ඇති වි තිබුණි. මේ සම්බන්ධයෙන් විගණන විමසුම්වලින්ද පෙන්වා දි තිබුණත්, එම බැරකම් නිරවුල් කිරීමට වසර 07 සිට 27 දක්වා කාලයක් ගතවී තිබුණද, එය නිරවුල් කිරීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 01 දින නිලධාරීන් 41 දෙනෙකුට ලබාදී තිබූ එකතුව රු.205,000 ක්වූ උත්සව අත්තිකාරම් අයකිරීම, ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.7 වගන්තියට පටහැනිව මාස 03 කාල ප්‍රමාදයකින් පසුව 2013 අගෝස්තු මාසයේදී ආරම්භ කර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත

වර්ෂයේදී අයකරගත හැකිව තිබූ රු.164,000 කින් රු.102,500 ක් පමණක් අයකරගෙන තිබුණි.

(iv) ඉදිරිපත් කරනු ලැබූ සැසඳුම් ප්‍රකාශය අනුව, ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 22 ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.224,815 ක ණය ශේෂය සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මෙම ශේෂවලින් රු.2,700 ක් වර්ෂ 5 සිට වර්ෂ10 දක්වාද, රු. 215,547 ක් වර්ෂ 13 ට වැඩි කාලයක සිට පැවැත එන ශේෂ විය.

(v) විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.662,019 ක ණය ශේෂ, සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.4 හා 4.2.5 වගන්ති ප්‍රකාරව විශ්‍රාම පාරිතෝෂික ගෙවීමේදී අයකර ගෙන නොතිබුණි. එම ශේෂයෙන් රු.548,788 ක් වර්ෂ 5 සිට වර්ෂ 13 දක්වා කාල පරාසයකද, රු.44.394 ක් වර්ෂ 13 ට වැඩි කාලයක සිටද හිඟහිටිව පැවතුණි.

(vi) වැඩ තහනම් කළ නිලධාරීන් 11 දෙනෙකුගෙන් හා සේවය හැර ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.524,651 ක් වූ ශේෂ විය. මෙම ශේෂ වර්ෂ 10 කට වැඩි කාලයක සිට පැවැත එන ශේෂ විය. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව මෙම ශේෂයන් අදාල ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 4.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
-----------------------------------------

### 4.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
----------------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඊට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

### 4.4.2 අභ්‍යන්තර විගණනය

රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කර තිබුණද, ඒ අනුව අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 4.5 වත්කම් කළමණාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 15 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව එම සමීක්ෂණ වාර්තා විගණනයට 2014 අප්‍රේල් 02 දින ඉදිරිපත් කර තිබුණි.

## 4.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| මුදල් රෙගුලාසි 188 (2) | 17,043 | මුදල් බැංකුගත කිරීමේදී බැංකු ප්‍රකාශන ආශ්‍රයෙන් ඒ මුදල් නිවැරදිව බැර වී තිබේ දැයි පරීක්ෂා කර බැලීමට වගකීම් බාර නිලධාරීන් විසින් සහතික විය යුතු වුවත්, 2010 වර්ෂයේ තැන්පත් කරන ලද වටිනාකම රු.17,043 ක් වු චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**(ආ) ජාතික අයවැය චක්‍රලේඛ**

**-------------------------**

| | | |
|---|---|---|
| 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | 1,321,678 | චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු නොකර දෙපාර්තමේන්තුවේ පැරණි වාහන 03 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.1,321,678 ක් වැය කර තිබුණි. |

## 4.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**-------------------------------------**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂයේදී විවිධ සේවා සමූපකාර සමිති මඟින් මෙගා කෝප් සිටි සුපිරි වෙළඳසැල් 40 ක් ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණද, 2014 අගෝස්තු 31 දින වන විටත් වෙළෙඳ සැල් 14 ක් පමණක් ආරම්භ කර තිබුණි. ඉන් 02 ක් 2014 අගෝස්තු 31 දින වන විටත් වසා දමා තිබුණි.

කෙසේ වුවත්, ආරම්භ කිරීමට සැලැසුම් කර තිබූ ඉහත මෙගා කෝප් සිටි සුපිරි වෙළඳසැල් 40 න් 12 ක් විවිධ හේතූන් මත ආරම්භ කිරීම නවතා තිබුණි. ඒ අනුව, ඉන් 08 ක සැලැසුම් සකස් කිරීම වෙනුවෙන් 2011 වර්ෂයේදී වැය කළ රු.1,656,462 ක් නිෂ්කාර්ය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 17 ක ඇස්තමේන්තුවක් යටතේ සමුපකාර පාරිභෝගික අංශය ප්‍රවර්ධනය කිරීමේ ඒකකයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීමට සැලැසුම් කර තිබුණද, ඒ සුදුසු අලෙවි උපදේශකයෙකු බඳවා ගැනීමට නොහැකි වීම මත එම ඒකකය ආරම්භ කිරීමේ කටයුතු 2014 අගෝස්තු 31 දින වන විටත් සිදුකර නොතිබුණි. කෙසේ වෙතත්, ඉහත තනතුර සඳහා පුද්ගලයෙකු බඳවා ගැනීම සඳහා පළ කළ පුවත්පත් දැන්වීම් හා සම්මුඛ පරීක්ෂණය සඳහා රු.111,423 ක් සමාලෝචිත වර්ෂයේදී දෙපාර්මේන්තුව විසින් වැය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ යුතු පහත සඳහන් ව්‍යාපෘති හා වැඩසටහන් 2014 අගෝස්තු 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(i). මුලධන උපයෝජනය පිළිබඳ කමිටුවක් පත්කිරීම.

(ii). සමුපකාර සමිති විගණනයට අදාලව දෙපාර්තමේන්තු මට්ටමින් ගිණුම් කාරක සභා පැවැත්වීම.

(iii). ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(iv). ගොවි සමූපකාර සමිති පිහිටුවීම.

## 4.8 කාර්යසාධනය

----------------

2013 වාර්ෂික ක්‍රියාකරී සැලැස්ම අනුව, ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියා නොකිරීම**

---------------------------------------------------

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාරි සැලැස්ම අනුව, 2012 වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව මුද්‍රණය කොට බෙදාහැරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළ දී අවසන් කළ යුතු වුවද, එහි බෙදාහැරීමේ කටයුතු 2014 ජුනි මාසයේදී අවසන් කර තිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැස්ම අනුව, සෑම මාස 02 කට වරක් පළාත් කොමසාරිස්වරුන්ගේ හමුවීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ රු.85,410 ක් වැය කර එවැනි හමු 02 ක් පමණක් පවත්වා තිබුණි. ඒ අනුව, පළාත් සම්බන්ධීකරණ කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) ක්‍රියාකාරි සැලැස්ම අනුව, 2012 වාර්ෂික කාර්යසාධන වාර්තාව සමාලෝචිත වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, විගණිත දිනය වු 2014 අගෝස්තු 31 දින වන විටත් 2012 හා 2013 වර්ෂ සඳහා වන එම වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ඈ) අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක මිල ස්ථාවරව පවත්වාගෙන යාමේ අරමුණින් 2010 වර්ෂයේ ආරම්භ කරන ලද ඒකාබද්ධ අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ චක්‍රිය අරමුදලේ කටයුතු පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 680.4 ක ප්‍රතිපාදන සළසා තිබුණි. වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව අරමුදලින් අපේක්ෂිත අරමුණ ළගා කර ගැනීම සඳහා ජාතික මිල කමිටුව මඟින් අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල තීරණය කිරීම, පළාත් සමුපකාර සංගම් සඳහා මිල ගණන් දැනුම්දීම හා එම කටයුතු අඛණ්ඩව අධීක්ෂණය හා මෙහෙයවීම දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබුණි.

**4.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

රේඛීය අමාත්‍යාංශය මඟින් සිදු කළ යුතු පළාත් සමුපකාර අමාත්‍යවරුන්ගේ හා ලේකම්වරුන්ගේ සමුළුව සඳහා අමාත්‍යාංශය විසින් රු.මිලියන 1.5 ක ප්‍රතිපාදන සළසා තිබුණත් සමාලෝචිත වර්ෂයේදී රු.279,038 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. කෙසේ වුවත්, 2012 වර්ෂයේදී පවත්වා නොතිබුණු ඉහත සමුළුවේ මූලික කටයුතු සඳහා රු.265,249 ක් දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණද, එම වියදම ප්‍රතිපූර්ණය කිරීම කළ නොහැකි බව අමාත්‍යාංශය විසින් දන්වා තිබුණි.

**4.10 විසඳා නොතිබූ විගණන ඡේද**

------------------------------

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද පිළිබඳ පසු විපරම් කටයුතු නිම නොකළ ඡේදවලට යොමුව පහත දැක්වේ.

| **විගණකාධිපති වාර්තාවට යොමුව** | | **යොමුගත විෂයය** |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2012 | 1.7. (IV) | සමුපකාර සමිතිවල විගණන කටයුතු සිදු කිරීම. |
| | 1.8 (අ) | පාරිභෝගික සංගමයකින් ණය අය කර ගැනීම. |
| | 1.9 | චක්‍රීය අරමුදලින් ණය සපයන ලද පළාත් සමුපකාර කොමසාරිස්වරුන්ගේ හා අනෙකුත් ආයතනවලින් ගිවිසුම් ප්‍රකාරව අය කර ගැනීම. |

**4.11 මානව සම්පත් කළමණාකරණය**

--------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 06 | 03 |
| (ii) තෘතියික මට්ටම | 07 | 01 | 06 |
| (iii) ද්විතියික මට්ටම | 105 | 91 | 14 |
| (iv) ප්‍රාථමික මට්ටම | 20 | 16 | 04 |
| එකතුව | 141 | 114 | 27 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 27 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 5. ශීර්ෂ 302 - සමුපකාර සේවක කොමිෂන් සභාව

### 5.1 විගණන විෂය පථය

සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 19 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 5.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සමුපකාර සේවක කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට සියයට 86 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රවාහන වැය විෂය සඳහා රු.360,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම වැය විෂයෙන් රු.170,000 ක් ප්‍රාග්ධන වැය විෂයයකට හා පුනරාවර්තන වැය විෂයයකට මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණි. ඒ අනුව වර්ෂය තුළ එම වැය විෂය යටතේ රු.190,000 ක ප්‍රතිපාදන පැවැතුණත්, ඉන් කිසිදු උපයෝජනයක් කර නොතිබුණි.

### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමට අදාළ දෙපාර්තමේන්තුවේ පොත් අනුව වර්ෂය අවසාන ශේෂය රු.2,103,090 ක් වී තිබුණත්, භාණ්ඩාගාර පොත් අනුව එය රු.2,142,051 ක් වී තිබුණි. ඒ අනුව රු.38,961 ක වෙනසක් පැවැතියත් මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව එම වෙනස දෙපාර්තමේන්තුවේ පොත් හා භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා නොතිබුණි.

**5.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**5.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**5.4.2 අභ්‍යන්තර විගණනය**

සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කර තිබුණද, ඒ අනුව, අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.5 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, භාණ්ඩ වර්ග 14 ක් ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් ඒවා වෙන්දේසි කර විකිණීමට නිර්දේශ කර තිබුණද, 2014 ජුනි 30 දින වන විටත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5.6 කාර්යසාධනය**

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

කොමිෂන් සභාව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා 2012 ජනවාරි 11 දින හා 2012 ඔක්තෝබර් 05 දින කමිටු පත්කර තිබුණද, සකස් කළ කෙටුම්පත් පනත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන සංශෝධන කිරීමට 2014 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) සමූපකාර සේවකයින් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම 2006 වර්ෂයේ යෝජිත ප්‍රධාන කාර්යයක් වූව ද, 2014 ජුනි 30 දින වන විටත් එම කාර්යය ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

(iii) සමූපකාර විනය කාර්ය පටිපාටි සංග්‍රහය සකස් කිරීම සඳහා පස් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් 2013 ජනවාරි 04 දින පත්කර තිබූ අතර එහි අවසන් වාර්තාව 2014 ජුනි 30 දින වන විටත් සකස් කිරීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

## 5.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සමූපකාර විනය කාර්ය පටිපාටි සංග්‍රහයේ කෙටුම්පත් මුද්‍රණය එළිදැක්වීම සඳහා රු.500,000 ක අරමුදල් සමූපකාර ව්‍යාපාරයේ ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මූල්‍යයනය කරගෙන තිබුණි. වියදම් කිරීම සම්බන්ධ වාර්තා අදාළ ව්‍යාපෘතිය වෙත යවා නොතිබුණු අතර, එම වියදම් සම්බන්ධ විස්තර කොමිෂන් සභාව සතුව නොතිබුණි.

## 5.8 විසඳා නොතිබූ විගණන ඡේද

සමුපකාර සේවක කොමිෂන් සභාවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු පහත සඳහන් විගණන ඡේද සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු නිමකර නොතිබුණි.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2012 | 1.6 | 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත සංශෝධනය හා විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක නොකිරීම. |
| | 1.7 (i) (ii) | සේවක පුරප්පාඩු හා ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකිරීම. |
| | 1.4.4 | අභ්‍යන්තර විගණනයන් සිදුකර වාර්තා ඉදිරිපත් නොකිරීම. |

## 5.9 කළමණාකරණ දුර්වලතා

කොමිෂන් සභාව සතු සංචිත වාහනවල දෛනික ධාවන සටහන්, වාහන ලොග් පොත් විධිමත් පරිදි පවත්වා නොතිබුණි.

**5.10 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 01 | 02 |
| (ii) ද්විතියික මට්ටම | 14 | 11 | 03 |
| (iii) ප්‍රාථමික මට්ටම | 06 | 02 | 04 |
| **එකතුව** | **23** | **14** | **09** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 09 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ii) කොමිෂන් සභාවේ ලේකම් තනතුර සඳහා 2013 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු පත්කර තිබූ අතර 2008 වර්ෂයේ සිට 2014 ජුනි 30 දින වන විටත් මෙම තනතුර සඳහා ස්ථිර පදනමට ලේකම්වරයෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි.